**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

## අදියර I විභාගය - 2022 ජූලි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා උත්තර සැපයීමේදී බොහෝ විභාග අයදුම්කරුවන් ප්‍රමාණාත්මක මට්ටමින් උත්තර සපයා තිබූ බව පෙනේ. කෙසේවෙතත්, සමස්තයක් වශයෙන් ගත් කල ඇතැම් ප්‍රශ්න සඳහා බොහෝ අයදුම්කරුවන් සපයා තිබූ උත්තරවල යම් යම් අඩුපාඩුකම් දක්නට ලැබුණි. ඒ අනුව උත්තරපත් පරීක්ෂා කිරීමේදී ඒ පිළිබඳව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

## A කොටස

### ප්‍රශ්න අංක 01

සමස්තයක් ලෙස ආර්ථික විද්‍යා විෂයෙහි පුළුල් පරාසයක් මුළු ලකුණු ප්‍රමාණයෙන් 40%ක් වන සේ ආවරණය වන පරිදි ආර්ථික විද්‍යා න්‍යායන් හා සංකල්ප වලින් මෙම කොටස සමන්විත වේ.

ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා, දෙන ලද වාස්තවික ප්‍රශ්න/උත්තර වලින් නිවැරදි තේරීමත්, ප්‍රශ්න අංක **1.11** සිට **1.12** දක්වා දෙන ලද උත්තර දෙකෙන් නිවැරදි උත්තර ලිවීමටත්, ප්‍රශ්න අංක **1.13** සිට **1.15** දක්වා දෙන ලද ප්‍රකාශයන් සත්‍ය ද අසත්‍ය ද යන බව ප්‍රකාශ කිරීමටත්, ප්‍රශ්න අංක **1.16** සිට **1.20** දක්වා ප්‍රශ්නවලට කෙටි උත්තර සැපයීමකත් මෙම කොටසින් අපේක්ෂා කෙරේ.

**1.1** ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත් සම්බන්ධව අවබෝධය මැනීම සඳහා දී ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් පිරිසක් නිවැරදි උත්තරය ලෙස ආර්ථික නොවන සම්පතක් ලෙස හතරවන පිළිතුරවන හිරුඑළිය සඳහන් කර ලකුණු දෙකක් ලබාගෙන තිබුණි.

**1.2** පාරිභෝගික හැසිරීම හා වෙළෙඳපොළ පිළිබඳ අවබෝධය මැනීමට ඉල්ලුම් වක්‍රය වමට විතැන්වීමට හේතුවක් නොවන්නේ යන්නට බොහෝ අයදුම්කරුවන් නිවැරදි උත්තරය ලෙස පළමු උත්තරය වන ආදේශන භාණ්ඩවල මිල ඉහළයාම සඳහන් කර තිබුණත්, සමහර අයදුම්කරුවන් ඒ ගැන අනවබෝධයකින් යුතුව, හතරවන උත්තරය වන අනුපූරක භාණ්ඩවල මිල ඉහළ යාම ලෙස සඳහන් කර තිබුණි.

**1.3** මෙම ප්‍රශ්නයද ඉහත ප්‍රශ්නය පරිදිම වූ ප්‍රශ්නයකි. අයදුම්කරුවන් බොහෝ විට, වැරදි උත්තර සපයා තිබුණි. උත්තර වැරදි සහගත ලෙස ප්‍රශ්න නම්‍ය වේ ලෙස පවසා ඇත. නිවැරදි උත්තරය අංක එක වන පූර්ණ අනම්‍ය යන්න වේ.

**1.4** නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම මැනීමට මෙම ප්‍රශ්නය සකස් කර ඇත. මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුර වන අංක දෙක ලියා ලකුණු ලබාගෙන තිබුණි.

**1.5** ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීමට මහ බැංකු වාර්තාව, සඟරා හා වෙනත් පොත් පත් කියවා නොතිබූ අයදුම්කරුවන් වැරදි උත්තර ලියා ලකුණු නොලැබූ අතර, මහබැංකු වාර්තාව පරිශීලනය කළ අයදුම්කරුවන් 2021 වසරේ ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම ඇමරිකානු ඩොලර් 3,815 ලෙස සඳහන් කර ලකුණු ලබාගෙන තිබුණි.

**1.6** නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන ශ්‍රිත සම්බන්ධ දැනුම මැනීමට දී ඇති ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් අංක (2) නිවැරදි උත්තරය ලෙස සපයා ලකුණු ලබාගෙන තිබුණි.

**1.7** විවධ වෙළෙඳපොළවල්වලට ආවේණික ලක්ෂණ පිළිබඳ අවබෝධය මැනීමට දී ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් අංක 03 නිවැරදි උත්තරය ලෙස සපයා තිබුණ ද, සමහර අයදුම්කරුවන් වැරදි සහගත ලෙස අංක 01 හි උත්තරය වන අබාධ පිවිසුම හා පිටවුම ලෙස සඳහන් කර තිබුණි.

**1.8** සූක්ෂම ආර්ථික විද්‍යාව යන සංකල්පය පිළිබඳ දැනුම මැනීමට දී ඇති මෙම ප්‍රශ්නයට නිවැරදි උත්තරය අංක 03 වුවත් බොහෝ අයදුම්කරුවන් වැරදි උත්තර සපයා ලකුණු නොලබා තිබුණි.

**1.9** මුදල් සැපයුම පිළිබඳ අවබෝධය මැනීමට දී ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයම්කරුවන් වැරදි උත්තර ලියා ලකුණු ලබාගෙන නොතිබුණි.

**1.10** උපයෝගිතා සංකල්පය පිළිබඳ දැනුම මැනීමට දී ඇති මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් වැරදි උත්තර සපයා තිබුණි. උපයෝගීතාවය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම අඩුබව පෙනේ. හතරවන උත්තරය නිවැරදි ලෙස ලියූ අයදුම්කරුවන් සිටියේ අතලොස්සකි.

**1.11** ව්‍යාපාරික ආර්ථික විද්‍යාව පිළිබඳ විවිධ ආර්ථික පද්ධති යටතේ අවබෝධය මැනීමට දී ඇති මෙම ප්‍රශ්නයට නිවැරදි උත්තරය සපයා ලකුණු ලබාගත් අය බොහෝ වේ.

**1.12** නිෂ්පාදනය පිළිබඳ අවබෝධය මැනීමට දී ඇති මෙම ප්‍රශ්නයටද නිවැරදි උත්තරය ලෙස ආන්තික නිෂ්පාදනය සපයා ලකුණු ලබාගත් අපේක්ෂකයින් බොහෝ වේ.

**1.13** පාරිභෝගික හැසිරීම හා වෙළෙඳපොළ පිළිබඳ දැනුම මැනීමට දී ඇති මෙම ප්‍රශ්නයට නිවැරදි උත්තර ලිවීමට සමහර අයදුම්කරුවන් පොත් පත් කියවා සූදානම් වූ බවක් නොපෙනේ. දී ඇති ප්‍රකාශය අසත්‍ය වුවත් සමහර අයදුම්කරුවන් සත්‍ය හෝ අසත්‍ය බව ලිවීමට අමතක කර ඇත.

**1.14** දී ඇති ප්‍රකාශය නිවැරදි වුවත් වැරදි උත්තර සැපයූ අයදුම්කරුවන් බොහෝ වේ. කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ වක්‍ර පිළිබඳ දැනුම අල්ප බව පෙනේ.

**1.15** නිෂ්පාදක සාධක පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට සමහර අයදුම්කරුවන් නිවැරදි උත්තර සපයා ඇති අතර සමහර අයදුම්කරුවන් ප්‍රාග්ධනයට ලාභ ලැබෙන අතර, ප්‍රාග්ධනය තුළින් ආදායමක් ලැබෙන බවට වැරදි සහගත ලෙස උත්තර සපයා තිබුණි.

**1.16** රජයේ හිඟ අයවැය යන්නට නිවැරදි උත්තර සැපයූ අයදුම්කරුවන් බොහෝ වේ. එහෙත් සමහර අයදුම්කරුවන් නිසි අවබෝධයකින් තොරව වැරදි උත්තර සපයා තිබුණි.

**1.17** රජය විසින් මිල පාලනය පැනවීම සඳහා බොහෝ අයදුම්කරුවන් විසින් නිවැරදි උත්තර සපයා තිබූ අතර, ඒකාධිකාරය පාලනය කිරීමට හා නිෂ්පාදකයින්ට ඇති ඉල්ලුම පාලනය කිරීමට යනාදී ලෙස වැරදි උත්තර සැපයූ අයදුම්කරුවන්ද වූහ.

**1.18** මුදලට ඇති ඉල්ලුම සම්බන්ධව අවබෝධය මැනීමට දී ඇති මෙම ප්‍රශ්නයට ද්‍රවශීලත්වය රැගෙන යාමට පහසු වීම යනුවෙන් වැරදි පිළිතුරු ලිවීමත් නිවැරදි උත්තර වන ගනුදෙනු, ආරක්ෂණ හා සමප්‍රේක්ෂණ චේතනාව යනුවෙන් ලියා ලකුණු ලබාගත් අපේක්ෂකයන්ද සිටියහ.

**1.19** ව්‍යාපාර ආයතනයක නිෂ්පාදන ශ්‍රිතය සම්බන්ධව දැනුම මැනීමට දී ඇති මෙම සංකල්පයට නිවැරදි අවබෝධයකින් උත්තර සපයා තිබුණේ අයදුම්කරුවන් අතලොස්සක් පමණි. සමහර අයදුම්කරුවන් කිසිදු උත්තරයක් ලියා නොතිබුණි.

**1.20** මානව සංවර්ධනයේ පැතිකට ලෙස ආදායම, අධ්‍යයනය, සෞඛ්‍ය ලෙස නිවැරදි උත්තර ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන්ද සිටි අතර සමහර අයදුම්කරුවන් කිසිම උත්තරයක් සපයා නොතිබුණි.

## <u>B කොටස</u>

(එක් කොටසකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.)

### ප්‍රශ්න අංක 02

**(a)** ආවස්ථික පිරිවැය යන සංකල්පය පිළිබඳව අසා ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් පිරිසක් නිවැරදිව උත්තර සපයා තිබුණි.

**(b)** මිශ්‍ර ආර්ථික ක්‍රමය මඟින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම සම්බන්ධවද නිවැරදි උත්තර සපයා ලකුණුලබාගත් අයදුම්කරුවන් බොහෝ දෙනෙක් සිටියහ.

**(c)** බොහෝ අයදුම්කරුවන් පිරිසක් ඒකාධිකාරී වෙළෙඳපොළක ලක්ෂණ නිවැරදිව සපයා තිබුණි.

### ප්‍රශ්න අංක 03

**(a)** ඉල්ලුම් හා සැපයුම් සමීකරණය අනුව සමතුලිත මිල හා ප්‍රමාණය නිවැරදිව ගණනය කර ලකුණු ලබාගත් බොහොමයක් අයදුම්කරුවන් සිටින අතර වීජ ගණිතමය දැනුම අවම අයදුම්කරුවන් මෙම සමීකරණයට වැරදි සහගත ලෙස ආදේශ කිරීමෙන් නිවැරදි උත්තරය ලබාගැනීමට අපොහොසත් වී ඇත. සමහර අයදුම්කරුවන් සමතුලිත මිල හා ප්‍රමාණය නිවැරදිව ගණනය කළද, පාරිභෝගික අතිරික්තය ගණනය කිරීම පිළිබදව දැනුවත් වී නොතිබුණි.

**(b)** සමහර අයදුම්කරුවන් අවම මිලක් පැනවීමේ ප්‍රතිවිපාක ඉතාමත් පැහැදිලිව, නිරවුල්ව පිළිතුරු සපයා තිබුණද, සමහර අයදුම්කරුවන් අවම මිලට, උපරිම මිලේ ආර්ථික ප්‍රතිවිපාක මාරුකර ලියා තිබුණි.

## ප්‍රශ්න අංක 04

**(a)** මිල මට්ටම, උද්ධමනය හා මිලදර්ශක පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට දී ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණද, සමහර අයදුම්කරුවන් කිසිඳු අදාලත්වයක් නොමැති උත්තර සපයා තිබුණි.

**(b)** ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තියේ ගුණාත්මක පාලනයන් ගැන අසා ඇති මෙම ප්‍රශ්නයට උත්තර සාර්ථකව ලියා නැත. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය ණය යෝජනා පිළිබඳ පිළිතුරු වැරදි සහගත ලෙස සපයා තිබුණි.

**(c)** ණය සැපයුම පාලනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව නිශ්චිත අදාල උත්තරය ඉදිරිපත් කර නොමැත. බැංකු පොළී අනුපාතය, සංචිත අනුපාතය, විවට වෙළෙඳපොළ කටයුතු පිළිබඳ බොහෝ අයදුම්කරුවන් ලියා නොමැත. සාර්ථකව ලකුණු ලබා නොගත් ප්‍රශ්නයක් ලෙස මෙය හැඳින්විය හැක.

## ප්‍රශ්න අංක 05

**(a)** ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ අවබෝධය මැනීමට කාලීනව ඉදිරිපත් කර ඇති මෙම ප්‍රශ්නය ඉතාම වැදගත් ප්‍රශ්නයකි. දැනට රටේ ආර්ථික තත්වය ගැන අවබෝධය පරීක්ෂාවට දී ඇති මෙම ප්‍රශ්නයට සමහර අයදුම්කරුවන් ලකුණු ලබාගැනීමට අසමත් වී ඇත.

සමහර අයදුම්කරුවන් ගණනය කිරීම නිවැරදිව සිදුකරීමට අපොහොසත් වී ඇති අතර සාපේක්ෂ වාසි න්‍යාය හා නිරපේක්ෂ වාසි න්‍යායන් පටලවාගෙන උත්තර ලියාතිබුණි. සමහර අයදුම්කරුවන් ගණනය කිරීම වෙන තැනක සිදුකර උත්තරය පමණක් ලියා තිබුණි. මේ නිසා සමහර අයදුම්කරුවන්ට මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමේ අවස්ථාව අහිමිව ගොස් තිබුණි.

**(b)** ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණ වීමට හේතු දැක්විමේ දී රට තුළ ඇති ඩොලර් සංචිත ප්‍රමාණය අඩු වීම නිසා විදේශ ණය ගෙවීමට නොහැකි විය. ශ්‍රී ලංකාවේ ප්‍රමාණය ඉක්මවා මුදල් අච්චු ගැසීම නිසා ඇතිවූ තත්වය පිළිබඳව අයදුම්කරුවන්ට අවබෝධයක් ඇතිබව ලියා තිබූ උත්තර මත ප්‍රකාශ කළ හැකිය.

මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන්ට මුළු ලකුණු ප්‍රමාණයම ලබාගැනීමට හැකි වී තිබුණි.

**(c)** ජාත්‍යන්තර වෙළඳාමේ වාසි ගැන අසා ඇති බව මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගෙන තිබුණි. මෙම 5 වන ප්‍රශ්නය බොහෝ අයදුම්කරුවන් පිරිසකට මුලු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට පහසුවූ ප්‍රශ්නයකි.

## C කොටස

**ප්‍රශ්න අංක 06**

**(A) (a)** ජාතික ගිණුම් සම්බන්ධ සංකල්ප ගැන මැන බැලීමට දි ඇති මෙම ප්‍රශ්නය පසුගිය ප්‍රශ්න පත්‍රවලට උත්තර ලියූ අයදුම්කරුවන්ට ඉතාමත් පහසු ප්‍රශ්නයකි. සෑම වසරක දීම මෙවැනි ප්‍රශ්නයක් ලබා දී දැනුම, අවබෝධය මනිනු ලැබේ.

සෑම අයදුම්කරුවෙකුටම මුළු 10 ක ලකුණු ප්‍රමාණයෙන් ලකුණු 6 ක ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් වී තිබුණි. සමහර අයදුම්කරුවන් නිෂ්පාදන මත සහනාධාර අඩු කළ පසු වෙනත් බදු හා නිෂ්පාදන හා ආනයන මත ශුද්ධ බදු පටලවාගෙන තිබුණි. ගණිතමය දෝෂ සහ එකතු කිරීමේ දෝෂ නිසාද නියමිත ලකුණු ලබාගැනීමට අපොහොසත් වි ඇත.

**(b)** දළදේශීය නිෂ්පාදිතයට ඇතුළත් නොවන ඵලදායී ආර්ථික ක්‍රියාකාරකම් වලට බොහෝ අයදුම්කරුවන් සාර්ථක උත්තර සපයා තිබුණි.

උදා :- ගාස්තු නොගෙන ගෘහ සේවයේ යෙදිම.

ගාස්තු ගෙවීමකින් තොරව ලැබෙන ස්වභාවික සම්පත් (ජලය, වාතය, භූමිය)

**(B)** බොහෝ අයදුම්කරුවන් සාධාරණ ආදායම් ව්‍යාප්තියේ හා පූර්ණ සේවා නියුක්තිය අතර වෙනස නිවැරදිව ලියා මුළු ලකුණු ලබාගෙන තිබුණි.

පූර්ණ සේවා නියුක්තිය යනු රටක රැකියා අපේක්ෂිත සියළු අය හට රැකියා ලැබීම යනුවෙන් වැරදි සහගත ලෙස උත්තර ලියූ අයදුම්කරුවන් ද සිටින ලදී.

**(C)** සම්පත් සම්භාරයේ වැඩිවීම, සම්පත්වල ඵලදායීතාවයේ වැඩිවීම, සාර්ව ආර්ථික ස්ථායිතාවය යනාදි කරුණු රටක ආර්ථික වර්ධනය තීරණය කරන සාධක ලෙස නිවැරදිව ලියූ අයදුම්කරුවන් සිටින ලද අතර සමහර අයදුම්කරුවන් අදාල නොවන කරුණුද ඉදිරිපත් කර තිබුණි. සමස්තයක් ලෙස බොහෝ අයදුම්කරුවන් මේ සඳහා ලකුණු ලබාගෙන තිබුණි.

- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොදින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත් ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

- * * * -